European Asylum, Migration and
Integration Fund

# යුරෝපිය ප්‍රතිසංකලන ජාලිය විශේෂිත ක්‍රියාකාරි වැඩසටහන- කෙටි හැඳින්වීම

# (EUROPEAN REINTEGRATION NETWORK (ERIN) SPECIFIC ACTION PROGRAM BRIEFING NOTE

## උපදෙස් පත්‍රිකාව

## ශ්‍රී ලංකාව

(ද්‍රවිඩ භාෂාවෙන්ද ලබාගත හැකිය)

ඕස්ට්‍රේලියාව, ඕස්ට්‍රියාව, බෙල්පියම, ඩෙන්මාර්කය, ෆින්ලන්තය, ප්‍රංශය, ජර්මනිය, ග්‍රීසිය, ඉතාලිය, ලක්සැම්බර්ග්, මෝල්ටාව, නෙදර්ලන්තය, නෝර්වේ, රුමේනියාව, ස්පාඤ්ඤය ස්විඩනය, ස්විස්ටර්ලන්තය හා එක්සත් රාජධානියේ සිට ආපසු පැමිණෙන ශ්‍රී ලාංකිකයින් සඳහා පශ්චාත් සම්ප්‍රාප්ති හා ප්‍රතිසංකලන සහය.



## 1. යුරෝපීය ප්‍රතිසංකලන ජාලිය විශේෂිත ක්‍රියාකාරී වැඩසටහන

## (ERIN SPECIFIC ACTION PROGRAMME)

යුරෝපීය ප්‍රතිසංකලන ජාලිය විශේෂිත ක්‍රියාකාරී වැඩසටහන යනු 2016 ජුනි මාසයේ 01 වැනිදා සිට 2017 මැයි 31 වැනිදා දක්වා ක්‍රියාත්මක වන ඒකාබද්ධ ප්‍රතිසම්ප්‍රාප්ති හා ප්‍රතිසංකලන ව්‍යාපෘතියක් වන අතර එයින් ඉලක්ක කෙරෙන්නේ ඊට සහභාගි වන එරින් හවුල් කාර ආයතන මලින් ලැබෙන අමතර සහයත් ලබාගනිමින් තෙවැනි රටක රටවැසියන්ට සිය රටට ආපසු පැමිණ පසු තිරසාර ප්‍රතිසංකලනයක් උදෙසා සහය වීමයි. එරින් ගොඩනැගෙන්නේ 2012 සිට 2014 දක්වා ක්‍රියාත්මක වූ යුරෝපීය ප්‍රතිසංකලන සාධන පත්‍ර ව්‍යාපෘතිය මතය. එරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද්දේ 2014 ජුනි මස සිට 2016 මැයි මස දක්වාය'

එරින් විශේෂ ක්‍රියාකාර කම් සඳහා 90% ක් අරමුදල් සපයනු ලබන්නේ යුරෝපා හවුල්කාර ආයතනය (යුරෝපීය සරණාගත, සංක්‍රමණ හා ඒකාබද්ධ අරමුදල) මෙන්ම යුරෝපීය රාජ්‍යයන් 18 සහභාගිත්වයෙන්ය (ඕස්ට්‍රේලියාව, ඕස්ට්‍රියාව, බෙල්ජියම, ඩෙන්මාර්කය, ෆින්ලන්තය, ප්‍රංශය, ජර්මනිය, ග්‍රීසිය, ඉතාලිය, ලක්සැම්බර්ග්, මෝල්ටාව, නෙදර්ලන්තය, නෝර්වේ, රුමේනියාව, ස්පාඤ්ඤය ස්විඩනය, ස්විස්ටර්ලන්තය හා එක්සත් රාජධානිය)

මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන්නේ එරින් හවුල්කාර ආයතන 19 විසිනි. එනම් ඕස්ට්‍රියාව- අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශය, ඕස්ට්‍රිලියාව -ආගමන සහ දේශ සිමා ආරක්ෂණ දෙපාර්තුමේන්තුව, බෙල්ජියම- ෆෙඩරල් ආගමන විගමන කාර්යාලය සහ රැකවරණය පතන්නන් පිළිබඳ ෆෙඩරල් ආයතනය, ඩෙන්මාර්කය- විදේශ කටයුතු අමාත්‍යාංශය, ෆින්ලන්තය- රොජේෂියානු ආගමන විගමන සේවාවා, ප්‍රංශය- ආගමන සහ ඒකාබද්ධ කාර්යාලය, ජර්මනිය- සංක්‍රමණිකයන් සහ සරණාගතයන් සඳහා වන ෆෙඩරල් කාර්යාලය, ග්‍රීසිය- මහජන සාමය සහ පුරවැසි ආරක්ෂක අමාත්‍යාංශය, ඉතාලිය- අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශය, ලක්සම්බර්ග්- යුරෝපීය සහ විදේශ කටයුතු අමාත්‍යාංශය, මෝල්ටාව- ස්වදේශ කටයුතු සහ ජාතික ආරක්ෂාව පිළිබඳ අමාත්‍යාංශය, නෙදර්ලන්තය- නැවත තමරටට ගෙන්වා ගැනීම සහ පිටවීමේ සේවාව, නෝර්වේ- ආගමනිකයන් සඳහා වන නෝර්වේජියානු අධ්‍යක්ෂක මණ්ඩලය, රුමේනියාව- ආගමනිකයන් සඳහා වන සාමාන්‍ය පරීක්ෂක මණ්ඩලය, ස්පාඤ්ඤය- සංක්‍රමණිකයන් සඳහා වන ඒකාබද්ධ සංක්‍රමණික මණ්ඩලය, ස්විඩනය- ස්වීඩන් සංක්‍රමණ නියෝජිතායතනය, ස්විස්ටර්ලන්තය- සංක්‍රමණය සඳහා වන රාජ්‍ය ලේකම්, එක්සත් රාජධානිය- ආගමන බලාත්මක කිරීමේ කාර්යාලය සහ තෝරාගත් දේශිය සේවා සපයන්නන් සමග එරින් රටවල් වලින් පැමිනෙන්නන් සඳහාය.

## 2. සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානයේ (IOM) මෙහෙවර ප්‍රකාශය.

සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM) මානව හා ක්‍රමවත් සංක්‍රමණය" සංක්‍රමණිකයන් හා සමාජය යන දෙකටම ප්‍රතිලාභි වන්නේය යන මූල ධර්මයට කැප වී සිටී. 1951 වර්ෂයේදි සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM) පිහිටුවන ලද්දේ සංක්‍රමණය කළමනාකරණය කිරීමට" රජයන්ට සහය වීමට හා සංක්‍රමණිකයින්ට සංක්‍රමණ ක්‍රියාවලියෙහි ලා සහය වීමටය. ලෝකය පුරා පිහිටි කාර්යාලයයන් හා නියෝජනයන් 481 කින් හා සාමාජික රාජ්‍යයන් 165 කින් සමන්විත එය අද වන විට ලෝකයෙහි සංක්‍රමණ ක්ෂෙත්‍රයෙහි ඇති ප්‍රධාන අන්තර්රාජ්‍ය සංවිධානය වන්නේය. වෙනත් ක්‍රියාකාරකම් අතර එහි වසර 30 ක පළපුරුද්ද තුළින් සංවර්ධනය කරගනු ලැබ ඇති ප්‍රවීණතාවයක් වන 'සහායික ස්වේච්ඡා ප්‍රතිසම්ප්‍රාප්ති හා පත්‍රිසංකලන වැඩසටහන (AVRR)' යටතේ ආපසු සිය රට පැමිණ නව ජීවිතයක් ගොඩනගා ගැනීම පිණිස ලොව පුරා සිටින මිනිසුන්ට සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM) සහය වෙයි. 1979 න් පසුව ලොව පුරා පැතිරී පවතින රටවල් 160 ක පමණ පුද්ගලයින්ට ආපසු සිය රටවලට පැමිණීමට සහය වීමේ අරමුණින් දියත් කෙරුන ව්‍යාපෘතින් 100 කට වඩා ඇතුලත් වන

සේ AVRR ක්‍රියාකාරකම් වර්ධනය වී ඇත. පසුගිය දශකය තුළ පමණක් සංක්‍රමණිකයින් මිලියන 3.5 කට වැඩි සංඛ්‍යාවකට සිය රටවල් බලා ස්වේච්ඡාවෙන් ආපසු පැමිණීමට සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM) සහය ලබා දී ඇත.

සංක්‍රමණයට අදාලව වර්ධනය වෙමින් පවතින මෙහෙයුම් අභියෝගයන්ට මුහුණ දීමට සහය වීම සඳහාද, සංක්‍රමණ ගැටළු කලින් අවබෝධ කරගැනීම සඳහාද, සංක්‍රමණය හරහා සමාජයීය හා ආර්ථික සංවර්ධනය සාක්ෂාත් කරගැනීම දිරිමත් කිරීම සඳහා හා සංක්‍රමණිකයින්ගේ යහ පැවැත්ම හා මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහාද, සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM) ජාත්‍යන්තර ප්‍රජාව තුළ සිටින සිය පාර්ශවකරුවන් සමග එක් වී කටයුතු කරයි.

## 3. පූර්ව ආගමන තොරතුරු.

තමන් ආපසු පැමිණි විට තමා වෙනුවෙන් ඇති යුරෝපීය ප්‍රතිසංකලන ජාලීය විශේෂිත ක්‍රියාකාරී වැඩසටහනේ සේවාවන් පිළිබඳව අදාල යුරෝපීය හවුල්කාර ආයතනයන් විසින් ආපසු සියරට බලා යාමට බලාපොරොත්තුව සිටින සංක්‍රමණිකයන් දැනුවත් කරනු ලබනවා ඇත. අයදුම්කරුගේ පැතිකඩ හා තොරතුරු උපදේශනයේදී මතු වූ අවශ්‍යතාවයන් මත පදනම් වෙමින් ලබා දිය යුතු සහය උපදේශකයන් විසින් හඳුනාගනු ලබනවා ඇත. සෑම යුරෝපීය හවුල්කාර ආයතනයක් සතුවම පිළිගැනීමේ මධ්‍යස්ථාන හා (පරිපාලන) රැඳවුම් මධ්‍යස්ථානයන්හි, එවැනි තැන් වල රැඳී සිටින ආපසු සියරට බලා යාමට බලාපොරොත්තුව සිටින සංක්‍රමණිකයන් වෙත පෙර-ආගමන උපදේශන ලබා දීම සඳහා සැදී පැහැදී සිටින උපදේශක වරුන් ඇත. එවැනි රැස්වීම් අවිධිමත් හා මිත්‍රශීලී ආකාරයකයින් පැවැත්විය යුතු වන අතර සහභාගී වන්නන් රැස්වීමේ අරමුණ පැහැදිලිව අවබෝධ කරගැනීමට හා අපහසුතාවයකින් තොරව ඔවුනට ප්‍රශ්න ඇසීමට වග බලාගත යුතුවේ

පහත තොරතුරු විශේෂ අවධාරණයකින් යුතුව සැපයිය යුතුය:

- කරුණාකර සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM) හා සම්බන්ධ වීමේ තොරතුරු ආගමනයට පෙර ප්‍රතිසම්ප්‍රාප්තිකයාට ලබා දෙන්න.
- ප්‍රතිසංකලන පැකේජය ආගමනයට පෙර හැකිතාක් දුරට නිර්වචනය කරන්න, නොඑසේ නම් ඔහුට හෝ ඇයට අපේක්ෂා කළ හැකි ප්‍රතිසංකලන ප්‍රදානයන් පිළිබඳව අයදුම්කරු වෙත දැනුම් දෙන්න.
- ස්ව කැමැත්තෙන් තොරව ආපසු පැමිණෙන්නන්ට වඩා ස්වේච්ඡාවෙන් ආපසු පැමිණෙන්නන් වඩාත් විශාල ප්‍රතිසංකලන පැකේජයන් දීම මගින් දිරිමත් කරනු ලබනවා ඇත.
- ස්ව කැමැත්තෙන් තොරව ආපසු පැමිණෙන්නන් ශ්‍රී ලංකාව තුළට පිළිගෙන වැඩසටහනට ඇතුලත් කරගැනීමෙන් පසුව සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM) ඔවුනට සහාය වනු ඇත.
- ඔබ ආපසු පැමිණීමට පෙර ඔබගේ වෛද්‍ය වාර්තා හා/හෝ අධ්‍යාපන හා පුහුණු සහතික ඔබ ආපසු පැමිණෙන රටේ භාෂාවට හෝ (එසේ නොහැකි නම්) ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරගන්නා ලෙස ඔබ ධෛර්යමත් කරනු ලැබේ. ඔබගේ දේශීය ආයතනයන් තුළ ලියාපදිංචි වීමට හා ඔබගේ වෛද්‍ය ප්‍රතිකාර තවදුරටත් කරගෙන යාමට එමගින් පහසුව සැලැස්වෙනු ඇත.
- පශ්චාත් සම්ප්‍රාප්ති ප්‍රතිසංකලන සහය සඳහා තමා ආපසු පැමිණෙන රටේ ඇති සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය ඇමතිය හැකි බවට ස්වේච්ඡාවෙන් හා ස්ව කැමැත්තෙන් තොරව ආපසු පැමිණෙන්නන් ඇතුළු ඉලක්ක කණ්ඩායම් යුරෝපීය හවුල්කාර ආයතන උපදේශකයින් විසින් (ආපසු පැමිණීමට කලින්) දැනුවත් කරනු ලබනවා ඇත.
- ආපසු පැමිණීම සඳහා අවශ්‍ය සහය යුරෝපීය හවුල්කාර ආයතන විසින් සපයනු ලබන අතර සම්ප්‍රාප්තියෙන් පසුව සිය ජීවිත ස්වාධීනව ගොඩනගාගැනීමට හැකි වන පරිදි සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය විසින් ප්‍රතිසංකලන සහාය ලබා දෙනු ඇත.

- තොරතුරු උපදේශන රැස්වීම්.
- කාන්තාවන්, ළමයින් හා වියපත් තැනැත්තන්ද කුඩා දරුවන් සහිත තනි දෙමාපියන්ද වැනි පීඩාවට පත්වීමේ විභවතාවයකින් යුත් පුද්ගලයින්ගේ ආපසු පැමිණීම සැලසුම් කිරීමේදී සමාජයීය හා ආර්ථික සාධකයන් සැලකිල්ලට ගත යුතුය.

**පහත පරාමිතින්ට අනුව භාරකරුවකු නොමැතිව ආපසු පැමිණෙන ළමයින්ට ඒ ඒ අවස්ථාව හා තත්වයන් අනුව ප්‍රතිසංකලන සහය ලබාදීමට හැකිය**

1. **සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය විසින් පහත සඳහන් ලෙස කටයුතු කරනු ඇත -**

   අ) ආගන්තුක රට හා උපන් රට යන දෙකේම අදාල ළමයාගේ නීත්‍යානුකූල භාරකරුවන්ගේ අනන්‍යතාවය තහවුරු කරගැනීම (හෝ අදාල වන පරිදි තෙවැනි රටක, එම රටේ නෛතික අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි)

   ආ) භාරකරුවකු නොමැතිව ආපසු පැමිණෙන සංක්‍රමණික ළමයාගේ ආපසු පැමිණීම ඒ ළමයාගේ හොඳම සුභ සිද්ධියට හේතු වන බව 'හොඳම සුභ සිද්ධි විනිශ්චය ක්‍රියාවලිය' මගින් නිගමනය කර ඇති බවට තහවුරු කර ගැනීම

   ඇ) සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය විසින් පවුල් තක්සේරුව නිම කර ඇති බවට තහවුරු කරගැනීම

2. සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානයේ සහය තීරණය කරනු ලබන්නේ 'හොඳම සුභ සිද්ධි විනිශ්චය ක්‍රියාවලියේ' ප්‍රතිඵලය හා ආපසු සිය රටට යාමට ළමයා තුළ ඇති තහවුරු වූ කැමැත්ත පදනම් කරගෙනය.

3. භාරකරුවකු නොමැතිව ආපසු පැමිණෙන සංක්‍රමණික ළමයා තුළ ඇති පීඩාවට භාජනය වීමේ විභවතාවය නිසාත් ආරක්ෂාව හා සහාය පවත්වාගෙන යාමේ ඉහලම ප්‍රමිතින් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් සංවිධානය දක්වන උනන්දුව නිසාත් සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය පොදුවේ ළමා ආරක්ෂණය පිළිබඳ යුනිසෙෆ් සංවිධානයේ ප්‍රතිපත්තීන් අනුගමනය කරනු ඇත.

4. භාරකරුවකු නොමැතිව ආපසු පැමිණෙන සංක්‍රමණික ළමයකුගේ 'සහායික ස්වේච්ඡා ප්‍රතිසම්ප්‍රාප්ති හා පත්‍රිසංකලන වැඩසටහන (AVRR)' පහසුකරණය කිරීමට පෙරාතුව සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය විසින්:

   අ) ළමයා උපන් බිමට ආපසු යාම ළමයාගේ ඉහලම සුභ සිද්ධියට හේතු වන බව තහවුරු කරමින් ආගන්තුක රටේ මෙන්ම උපන් රටේද නෛතික භාරකරුවන්ගෙන් තහවුරු ලිපි ලබාගැනීම කරනු ඇත.

   ආ) අ) දෙමාපියන්ගේ හෝ නෛතික භාරකරුවන්ගේ අනන්‍යතාවය හා ළමයාට අවුරුදු 18 සම්පූර්ණ වන තෙක් ඔහු/ඇය බලාගැනීමේ කැමැත්ත හා හැකියාව ඔවුනට තිබෙන බවට තහවුරු කර ගැනීමට හා ආ) සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානයේ සහාය ලබාදීමේ හැකියාව විනිශ්චය කිරීමටත් පවුල් තක්සේරුවක් කරනු ඇත.

**ස්වේච්ඡාවෙන් තොරව ආපසු පැමිණෙන්නන්**:

- පිටත් කර හරින/ආගන්තුක රටවල් හා ශ්‍රී ලංකා රජය අතර ද්විපාර්ශවික ගිවිසුමක් තිබේනම් උපන් රට වෙත අකැමැත්තෙන් ආපසු පැමිණෙන අයට සහය වීමට සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානයට හැකියාව තිබේ. එසේ සහාය වීම ආරම්භ කිරීමට පෙර එසේ ආපසු යැවීම සඳහා පිටත් කර හරින රට වෙත උපන් රට විසින් අනුමැතිය දී ඇති බව තහවුරු කරන ලෙස සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය විසින් ආගන්තුක රටෙන් ඉල්ලා සිටිනු ඇත.

- පිටත් කර හරින හා භාරගනු ලබන රටවල් දෙකම විසින් එසේ සහය දෙනු ලැබීම උචිත බවට සලකනු ලබන්නේනම් එවැනි ප්‍රතිසම්ප්‍රාප්තිකයින්ට සහාය වීමට ශ්‍රී ලංකාවේ සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානයට හැකියාව ඇති අතර එසේ කළ හැක්කේ ආපසු එවීමේ ක්‍රියාවලිය නිම වීමෙන් පසුව පමණකි. කෙසේ වුවද, සංක්‍රමණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය විසින් සපයනු ලබන පශ්චාත් සම්ප්‍රාප්ති සහාය ලබාගත හැකි වීම බලහත්කාරයෙන් ආපසු එවීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමෙහිලා තීරණාත්මක සාධකයක් නොවනු ඇත.
- ශ්‍රී ලංකාවේ සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය අකැමැත්තෙන් ආපසු සියරට පැමිණෙන්නන් හට ගුවන් තොට සම්ප්‍රාප්ති සහාය ලබා දෙන්නේ නැත.

## 4. සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය - ශ්‍රී ලංකාව

ශ්‍රී ලංකාවේ සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය පසුගිය දස වසර මුළුල්ලේ ප්‍රතිසංකලන කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලාංකික ස්වේච්ඡා සංක්‍රමණිකයින් හට සහාය ලබා දී ඇත. යුරෝපය, ඕස්ට්‍රේලියාව, අප්‍රිකාව හා ආසියානු රටවලින් ආපසු පැමිණි ශ්‍රී ලාංකිකයින් 4500 කට වැඩි පිරිසකට ශ්‍රී ලංකාවේ සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය සිය සහාය ලබා දී ඇත. මෙම ආපසු පැමිණියවුන්ගෙන් බොහෝ දෙනෙක් දේශපාලන රැකවරණ පතා ගොස් එය අසාර්ථක වූ අය හෝ අක්‍රමවත්/අතරමං වූ සංක්‍රමණිකයින් වූ අතර ඔවුනට පුළුල් පරාසයක සේවාවන් අවශ්‍යව තිබිණි.

ශ්‍රී ලංකාවේ කොළඹ" උතුරු හා නැගෙනහිර පළාත්වල පිහිටා ඇති උප කාර්යාල ජාලය හා පළපුරුදු සේවක මණ්ඩලය නිසා යාවත්කාලීන තොරතුරු සැපයීම, ක්ෂෙත්‍ර මට්ටමේදී සම්ප්‍රාප්තිකයින් නිරන්තරයෙන් පිළිගැනීම හා නිවැරදි දිශාවට යොමු කිරීම, කුඩා පරිමාණ ව්‍යාපාර සංවර්ධනය, වෘත්තිය පුහුණුව හා රැකියාවන් වෙත යොමු කිරීම යන ආකාරයන්ගෙන් ප්‍රතිසංකලන විසඳුම් ලබා දීම ආදිය හරහා සම්ප්‍රාප්තිකයින් හට සහය වීමට ශ්‍රී ලංකාවේ සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානයට හැකියාව ඇත.

රජයේ හවුල්කරුවන්, ආගන්තුක රට වල ඇති සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානයේ දූත මණ්ඩල හා ආපසු පැමිණෙන සංක්‍රමණිකයින්ගෙන්ම ලැබෙන ඉල්ලීම් පිළිබඳව කටයුතු කිරීමේදී ආපසු පැමිණීමේ හා ප්‍රතිසංකලනය වීමේ සෑම පියවරකදීම ආපසු පැමිණෙන්නන් විසින් මුහුණ දෙනු ලබන ගැටළු වේලාසන දකින ඵලදායක ප්‍රතිසම්ප්‍රාප්ති හා තිරසාර ප්‍රතිසංකලන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය යෝජනා කර සිටී.

තමන්ට අතිරේක ප්‍රශ්න තිබේනම් හෝ වැඩිදුර තොරතුරු අවශ්‍ය නම් පහත දැක්වෙන සබඳතා තොරතුරු ඔස්සේ සෘජුවම එම අවශ්‍යතා සපුරාගැනීමේ හැකියාව අනාගත සම්ප්‍රාප්තිකයින් හා යුරෝපීය හවුල්කාර ආයතන උපදේශකයින් සතුව තිබේ :

**ERIN වෙබ් අඩවිය:**
http://erin-iom.belgium.iom.int

**ERIN IOM හා ශ්‍රී ලංකාවේදී සම්බන්ධ වීමට:**

ප්‍රියන්ත කුලතුංග මහතා
වැඩසටහන් කළමනාකරු
සඳුදා සිට සිකුරාදා දක්වා පැය 08.30 සිට පැය 17.00 දක්වා ඇමතිය හැකිය.

විද්‍යුත් තැපෑල: MKULATUNGE@iom.int

දුරකථන: +94 11 5325 310; Fax: +94 11 5325 302

**ලිපිනය:**
සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය
62ල ග්‍රීන් පාත්, ආනන්ද කුමාරස්වාමි මාවත
කොළඹ 3 - ශ්‍රී ලංකාව

## 5. ශ්‍රී ලංකාවේ සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය මගින් සපයනු ලබන යුරෝපීය ප්‍රතිසංකලන ජාලීය විශේෂිත ක්‍රියාකාරී වැඩසටහනට අදාල 'සහායික ස්වේච්ඡා ප්‍රතිසම්ප්‍රාප්ති හා පත්‍රිසංකලන (AVRR)' සේවාවන්.

(ජාතික ඇමුණුමේ වෙනස් අයුරකින් සඳහන් කරනු ලැබ තිබුනොත් හැර) ප්‍රතිසංකලන සහය පැකේජය ලබා දෙන්නේ ද්‍රව්‍ය වශයෙන් වන අතර එසේ දෙන ප්‍රමාණයන් එවනු ලබන රට, ජාතික ප්‍රතිසංකලාන ප්‍රදාන, ආපසු පැමිණීමේ ස්වභාවය, ප්‍රතිලාභියාගේ ප්‍රතිරූපය හා අවශ්‍යතා අනුව වෙනස් වේ. තනිව ගමන් කරන බාල වයස්කරුවන් වෙත අතිරේක ප්‍රතිසංකලන සේවා සපයනු ලැබේ.

පිරික්සුමෙන්, අගැයීමෙන්, යුරෝපීය හවුල්කාර ආයතනයේ අගැයීමෙන් මෙන්ම පශ්චාත් සම්ප්‍රාප්තිකයනට සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය විසින් තව දුරටත් සිදු කරනු ලබන අවශ්‍යතා හඳුනාගැනීමකින් පසුව යුරෝපීය ප්‍රතිසංකලන ජාලීය ්‍යශේෂිත ක්‍රියාකාරී වැඩසටහනේ ප්‍රතිලාභීන් හට තනි තනි පදනමක් මත පහත සඳහන් සේවා ලබාගත හැකි වේ :

### එක් එක් අයෙකුට ගුවන් තොටට සම්ප්‍රාප්ත වීමේදී ලැබෙන සහාය

- සම්ප්‍රාප්තියේදී පිළිගැනීම හා සුභ පැතීම
- ප්‍රවාහන පහසුකම් සහාය : ඔබ ඉල්ලා සිටි විට රට තුළ වූ ඔබගේ අවසන් ගමනාන්තයට යාම සඳහා සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානයට ප්‍රවාහන පහසුකම් සැපයීමට සහය ්‍යය හැකි වන අතර ඒ සඳහා වැය වන මුදල ඔබේ ප්‍රතිසංකලන ප්‍රදානයෙන් අය කර ගනු ඇත.
- වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කිරීම්
- අවම වශයෙන් එක් සතියක් සඳහා තාවකාලික නවාතැන් පහසුකම් සපයා දීමට සහයවීම.

### ප්‍රතිසංකලන සහාය.

ප්‍රතිසංකලාන ප්‍රදානයන් පහත සඳහන් ප්‍රතිසංකලන සේවාවන් සඳහා යොදාගත හැකි වේ:

**කුඩා ව්‍යාපාර සඳහා සහාය:** ආර්ථික ස්වාධීනත්වය හා ආදායම් උත්පාදනය සඳහා කුඩා ව්‍යාපාර ක්‍රියාකාරකමක් ආරම්භ කිරීමට, නැවත ආරම්භ කිරීමට හෝ එවැනි ව්‍යාපාරයකට හවුල් වීමට: ඔබගේම ව්‍යාපාරය ආරම්භ කිරීමට ඔබ අදහස් කරන්නේනම් සුදුසු ව්‍යාපාරයක් හඳුනාගැනීමට IOM ඔබට සහාය වනු ඇත. ව්‍යාපාරයක් තෝරාගැනීම වෙනත් කරුණු අතර ඔබගේ පළපුරුද්ද හා ඔබ ආපසු සම්ප්‍රාප්ත වී ඇති ප්‍රදේශයේ ඇති වෙනත් ව්‍යාපාර මත පදනම් වනු ඇත.

රැකියා දිරිමත් කිරීම සඳහා **වේතන සහනාධාර දීමනාව:** සිය හවුල්කාර ජාලය හරහා ඔබ සේව්‍යයන් වෙත යොමු කිරීමට හා අදාල බඳවාගැනීම් පිළිබඳව සඳහන්ව ඇති වෙබ් ලිපිනයන් ඔබට ලබා දීමටත් ශ්‍රී ලංකාවේ සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානයට හැකියාව තිබේ. ඔබට රැකියාවක් ලැබුණහොත් වේතන සහනාධාරයක්/වේතන වර්ධනයක් වශයෙන් ඔබේ ප්‍රතිසංකලන සහාය මුදා හරිනු ඇත.

කුසලතා වර්ධනයට හා රැකියා ලබාගැනීමේ හැකියාව නංවා ලීමට **වෘත්තිය පුහුණුවට** යොමු කිරීම හැකියාව, පෙර වැඩ පළපුරුද්ද, අධ්‍යාපනය, උනන්දුව හා විශේෂිත කුසලතාවයන් කෙරෙහි දේශිය වෙළෙඳපොලෙහි ඇති ඉල්ලුම පදනම්ව පුහුණු හඳුනාගත හැකිය.

**තාවකාලික නවාතැන් පහසුකම්.** පැන නැගෙන අවශ්‍යතාවය මත තාවකාලික නවාතැන් පහසුකම් ලබා ගැනීමට සහයවීම.

ආපසු පැමිණීමෙන් පසු සෞඛ්‍යාරක්ෂණය ලබා ගැනීම සඳහා **වෛද්‍ය ගාස්තු ආවරණය** (ඖෂධ, වෛද්‍ය උපදෙස්)

**ළමයින් සඳහා අධ්‍යාපන හා පාසැල් වියදම්** හා අවශ්‍ය එන්නත් හා වෛද්‍ය ආරක්ෂණය.
දේශියව ලියාපදිංචි වීමේ හැකියාව ඔබට ඇති කිරීම සඳහා **නෛතික/පරිපාලන පිරිවැය.**

### පරිපාලන සහාය හා යොමු කිරීම්:

පහත සඳහන් පරිදි ඔබ වෙත පරිපාලන සහාය ලබා දීමට හා ඔබව යොමු කිරීමට සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානයට හැකියාව තිබේ:

- අන්තර්ජාතික, කලාපීය හා ප්‍රාදේශීය සේවා (රාජ්‍ය, රාජ්‍ය නොවන, පුද්ගලික අංශය)
- දේශීය රැකියා ආරම්භකිරීමේ මූලික කටයුතු
- ක්ෂුද්‍ර මූල්‍ය සංවිධාන
- පාසැල් වලට හා අධ්‍යාපනික ආයතනයන්ට ඇතුළත්වීම
- අධ්‍යාපනික හා වෘත්තීය පුහුණුව
- විශේෂිත වෛද්‍ය ආධාර
- මනෝ-සමාජයීය සහාය : ශ්‍රී ලංකාවේ සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානයේ කාර්ය මණ්ඩලය මේ සඳහා විශේෂඥ උපදේශක වරයකු විසින් පුහුණු කරනු ලැබ ඇත.
- දේශීය සමාජ ජාලය
- නෛතික උපදෙස්

## 6. ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු

### වෛද්‍ය ආරක්ෂාව

ශ්‍රී ලංකාවේ වෛද්‍ය ආරක්ෂණ ආයතන ජාලය බෙහෙවින්ම පවත්වාගෙන යනු ලබන්නේ රාජ්‍ය හා පෞද්ගලික අංශයන් මගිනි. රජය සියළු රාජ්‍ය ආරෝග්‍ය ශාලා හරහා මහජනතාව වෙත නොමිළයේ සෞඛ්‍යාරක්ෂණය සපයයි.

බෝ වන රෝග මත අවධානය යොමු කිරීමෙන් හා එන්නතින් වැලැක්විය හැකි රෝග සම්පූර්ණයෙන් තුරන් කිරීම හරහා මාතෘ හා ළමා සෞඛ්‍යය වැඩිදියුණු කිරීමෙන්ද ශ්‍රී ලංකාව සෞඛ්‍ය ප්‍රතිඵල අතින් සැලැකිය යුතු ප්‍රමිතියකට පත් වී ඇත.

ජීවන අපේක්ෂාව වැඩි වීමත් සමග වියපත් ජනගහනය වර්ධනය වීම නිසා කන්තුකවාහිනී රෝග, මධු මේහය, නිධාන්ගත ස්වසන රෝග, වෘක්කීය රෝග හා පිළිකා වැනි බෝ නොවන රෝගයන් වර්ධනය වීමේ ප්‍රවණතාවයක් ඇත.

මෑත වර්ෂයන් තුළදී සෞඛ්‍ය සම්පත් ශලා යාම වැඩි වී ඇති අතර කාලයත් සමග සංවර්ධනය වී ඇති සෞඛ්‍ය යටිතල පහසුකම් ඒ මගින් නොනැසී පවත්වාගෙන යාමේ හැකියාව උදා වී තිබේ. සෞඛ්‍ය බලධාරීන් විසින් පහත සඳහන් ප්‍රධාන සෞඛ්‍ය ගැටළු හඳුනාගනු ලැබ ඇත:

- වියපත් වුවන්ට හා ආබාධිතයින්ට සෞඛ්‍ය සේවාවන් සැපැයීමේ අසාධාරණ තත්ත්වයන්
- බෝ නොවන රෝග, සියදිවි හානි කර ගැනීම්, හර කෙලෙසීම හා මන්ද පෝෂණය වැඩි වීම

යුද්ධය අවසන් වීමෙන් පසු උතුරු පලාතට අවශ්‍ය සෞඛ්‍ය පහසුකම් සඳහා යටිතල පහසුකම් සැපැයීම සම්බන්ධ අභියෝගයකට සෞඛ්‍යාරක්ෂණ හා පෝෂණ අමාත්‍යංශය තවමත් මුහුණ දෙමින් සිටී.

මෙම රෝග පිළිබඳව හා රටේ දැනට පවත්නා යාවත්කාලීන තත්ත්වය පිළිබඳ තොරතුරු සෞඛ්‍ය අමාත්‍යංශයේ www.health.gov.lk, Epidemiology Unit www.epid.gov.lk. නිල වෙබ් අඩවියෙන් දැනගත හැකි වේ.

**සෞඛ්‍ය පහසුකම්.**

රජය සතු ආරෝග්‍ය ශාලා සෑම මහ නගරයකත්, ප්‍රධාන නගරයන් තුළත් පිහිටා ඇති අතර වෛද්‍ය පහසුකම් පරාසයක් සැපයීම සඳහා නවීන උපකරණයන්ගෙන් ඒවා සමන්විත වී ඇත. මේවායින් සැපයෙන සේවා ලැබෙන්නේ නොමිළයේය. කෙසේ වුවද රටේ ඇති ප්‍රධාන නිදහස් සෞඛ්‍ය පහසුකම් බෙහෙවින් සංකුල තත්ත්වයක ඇති අතර බොහෝ රජයේ රෝහල් වල රෝගීන්ගේ නේවාසිකත්වය 100% ඉක්මවා ගොස් ඇත. කොළඹ හා සියළුම පලාත් වල ඇති ප්‍රධාන නගරයන් තුළ හොඳම තත්ත්වයේ වෛද්‍ය උපකරණ වලින් සමන්විත ඉහල ප්‍රමිතියේ සේවාවන් සපයන පෞද්ගලික රෝහල් ඇති නමුත් ඒවායින් සැපයෙන්නේ මිළ අධික සේවාවන්ය.

සෞඛ්‍ය රක්ෂණය මගින් පුද්ගලික සෞඛ්‍ය වියදම් වලින් විශාල කොටසක් දරනු ලබන ආර්ථික අතින් ධනවත් රටක් මෙන් නොව, පෞද්ගලික සමාගම් විසින් සිය කාර්ය මණ්ඩල සාමාජිකයින් රක්ෂණය කරනු ලැබ ඇති අවස්ථාවන්හිදී හැර, ශ්‍රී ලංකාවේ පුද්ගලික සෞඛ්‍ය වියදම් සම්පූර්ණයෙන්ම මෙන් දරනු ලබන්නේ එම සේවාවන් භාවිතා කරන්නන්ම විසිනි.

කොළඹ නගරයේ පිහිටි රජයට අයත් රෝහල්, පෞද්ගලික රෝහල් හා සායනයන්ගේ ලැයිස්තුවක් සඳහා කරුණාකර http://www.lankalinksystems.com/directory/newsinfo/healthinfo.htm වෙබ් අඩවියට පිවිසෙන්න.

## නිවාස.

ජනගහණ වර්ධනය හා නාගරීකරණය සමග නිවාස සඳහා ඇති ඉල්ලුම වැඩි වී ඇත. පෞද්ගලික අංශයේ ක්‍රියාශීලි සහභාගිත්වය හා නිවාස සඳහා මූල්‍ය සම්පාදනයේ වැඩි දියුණුවත් සමග නිවාස සැපයුම අඛණ්ඩව වර්ධනය වී ඇත.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ඉඩම් වෙන් කර දීමෙන් හා මූල්‍ය පහසුකම් සැපයීම ආදියෙන් පවුල් වලට උපකාර කරයි. එම අධිකාරිය ප්‍රධාන රාජ්‍ය නිවාස වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි. තමන්ගේ සේවක අර්ථසාධක අරමුදල් ශේෂයන් ඇපයට තබාගනිමින් අඩු ආදායම්ලාභී පවුල් වෙත ණය පහසුකම් සැපයීම සඳහා රාජ්‍ය නිවාස මූල්‍ය ආයතනයන් ශක්තිමත් කරනු ලැබ ඇත. එතෙර සිට පැමිණෙන ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ගේ යහපත සඳහා සහනදායි ණය ක්‍රම තවදුරටත් පුළුල් කරන ලදි.

මීට අමතර වශයෙන් පුද්ගලික අංශය විසින් ආරම්භ කරනු ලැබ ඇති මහා පරිමාණ නිවාස, නගර හා සභාධිපත්‍ය සංවර්ධන ව්‍යාපෘතීන් ගණනාවක්ද ඇත. විකල්පයක් වන්නේ නිවසේ පිහිටීම අනුව බෙහෙවින් වෙනස් වන කුලී ප්‍රමාණයන්ට නිවාස කුලියට හෝ බද්දට දීමයි.

කොළඹ ඉඩම් හිඟ වීමත් සමග උස් තට්ටු නිවාස වල ජනප්‍රියත්වය 2006 වසර දක්වා ඉහල නැගුනි. මුලින් උස් තට්ටු නිවාස සීමා වී තිබුනේ කොළඹ 3, 5, 6, 7 හා 8 යන ප්‍රදේශයන්ටය. නිවාස සංකීර්ණයන් තුළ ඇති නොයෙකුත් පහසුකම් නිසා ඒවායේ කුලිය ප්‍රදේශයේ අනිකුත් නිවාස කුලී ප්‍රමාණයන්ට වඩා ඉහල අගයක් ගත්තේය. කෙසේ වුවද අද වන විට විසල් කොළඹ ප්‍රදේශයේ හා කොළඹ දිස්ත්‍රික්කයෙන් බැහැර වෙනත් ප්‍රධාන නගරයන්හිද උස් තට්ටු නිවාස ඇති අතර ඒවා සින්නක්කර මිළයට ගැනීමේ හා සාධාරණ කුලී ප්‍රමාණයන්ට කුලියට ගැනීමේ හැකියාව තිබේ.

වසර 25 ක් පැවැති යුද්ධය 2009 මැයි මාසයේ අවසාන වීමත් සමග නිශ්චල දේපල වෙළෙඳපොල ඉහල නගින්නට ආරම්භ වී ඇත.

වැඩි විස්තර සඳහා කරුණාකර පහත වෙබ් අඩවියට පිවිසෙන්න.
www.nhda.lk
http://www.lanka.info/Sri_Lanka/realestate/index.jsp

## රැකීරක්ෂා.

පෙර වර්ෂයේ සංඛ්‍යාව වූ මිලියන 8418 හා සසඳන විට 2014 වර්ෂයේදී රැකියා කරන්නන්ගේ සංඛ්‍යාව මිලියන 8424 ක් දක්වා සියයට 0.1 කින් ආන්තික වර්ධනයක් පෙන්වයි. මෙම වර්ධනය ප්‍රධාන වශයෙන්ම දැක්කේ එම අංශ දෙකෙහි සිදු වූ ව්‍යාප්තියේ සහායත් සමග කර්මාන්ත හා සේවා අංශයන්හිය. එසේ වුවද වර්ෂයේ වැඩි කොටසක් තුළ බල පැවැත්වුන අහිතකර කාලගුණ තත්ත්වයන් නිසා 2014 වර්ෂයේදී කෘෂි අංශය තුළ සේවයේ යෙදුනවුන්ගේ සංඛ්‍යාවේ අඩු වීමක්

දක්නට ලැබිනි. ඒ අනුව, කෘෂි අංශයේ රැකියා වල නිරත වූවන්ගේ සංඛ්‍යාව සියයට 28.5 ක් දක්වා පහත වැටිනි.

## ක්ෂුද්‍ර ව්‍යාපාර

කුඩා ව්‍යාපාරයක් ආරම්භ කිරීමට නම් අයිතිකරු පහත දැක්වෙන ක්‍රියා පටිපාටීන් ගැන දැන සිටිය යුතු වේ:

අ) ව්‍යාපාරය ප්‍රාදේශිය අධිකාරිය සමග ලියාපදිංචි කළ යුතුය. පාරිසරික අනුමැතින්ද ලබාගත යුතුය. ළඟම පිහිටි ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් ව්‍යාපාර ලියාපදිංචිය ලබාගත යුතුය. ලියාපදිංචිය සඳහා දල වශයෙන් රු. 1,000 ක් වැය වේ. වසරක් පාසා අළුත් කළ හැකි වෙනස් ව්‍යාපාර බල පත්‍රයක් පලාත් සභාවෙන්, නගර සභාවෙන් හෝ ප්‍රාදේශිය සභාවෙන් ලබාගත යුතුය. ව්‍යාපාරයේ ස්වභාවය අනුව මෙහි පිරිවැය වෙනස් වේ.

ආ) ව්‍යාපාරයේ හිමිකරුවා ව්‍යාපාරයේ මාසික පිරිවැටුම මත පදනම්ව ත්‍රෛමාසික බද්දක් වශයෙන් පලාත් පාලන ආයතනය වෙත නාමික මුදලක් ගෙවිය යුතුය. ව්‍යාපාරය ශබ්දය හෝ ගැස් හෝ වාශ්ප පිට කරන එකක් නම් ඒ සඳහා පාරිසරික අධිකාරියෙන් අනුමැතිය ලබාගත යුතුය. ව්‍යාපාරය ආහාර පාන (උදා: බේකරියක්, කෙටි කෑම කඩයක්, ආපන ශාලාවක් හෝ පේස්ට්‍රි කඩයක්) හා සම්බන්ධ එකක් නම් මහජන සෞඛ්‍ය පරීක්ෂකගෙන් ඒ සඳහා සහතිකයක් ලබාගැනීම අවශ්‍ය වේ.
ක්ෂුද්‍ර ව්‍යාපාර සඳහා විශේෂ ණය යෝජනා ක්‍රම තිබේ. තොරතුරු දැනගැනීම සඳහා කරුණාකර මෙම වෙබ් අඩවියට පිවිසෙන්න:

www.microfinance.lk.

ඉහත වැඩසටහන් වලට අමතරව විභව ව්‍යවසායකයින් හා කුඩා පරිමාණ ව්‍යාපාරයන් සඳහා උදව්, මුල්‍ය සහාය මෙන්ම අවශ්‍ය පුහුණුවද ලබා දෙන රාජ්‍යාන්තර හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන ගණනාවක් තිබේ.

## අධ්‍යාපනය හා පුහුණුව.

ශ්‍රී ලංකාවේ දැනට පවත්නා අධ්‍යාපන ක්‍රමය බ්‍රිතාන්‍ය අධ්‍යාපන ක්‍රමයෙන් පැවත එන්නක් වන අතර බ්‍රිතාන්‍ය යටත් විජිත පාලකයින් එය හඳුන්වා දුන්නේ 19 වැනි ශත වර්ෂයේදීය. බ්‍රිතාන්‍ය යටත් විජිත රජය පිරිමි ළමයින් හා ගැහැණු ළමයින් වෙනුවෙන් වෙන වෙනම විද්‍යාල පිහිටවීය. මෙම විද්‍යාල ප්‍රාථමික පාසැල්, පහල ද්විතියික හා උසස් ද්විතියික පාසැල් වලින් සමන්විත විය.

1931 ලැබුණ සර්වජන ඡන්ද බලයේ ප්‍රතිඵලයක් වශයෙන් 1938 දී රජයේ පාසැල් වලින් දෙන අධ්‍යාපනය නොමිළයේ දෙන්නක් බවට පත් කරන ලදි. ඉන් අනතුරුව මහා විද්‍යාල යනුවෙන් හඳුන්වනු ලබන රජයේ පාඨශාලා රාශියක් රටේ සෑම ප්‍රදේශයකම පිහිටුවන ලදි. මහා විද්‍යාල වල අධ්‍යාපන මාධ්‍යය වූයේ සිංහල හෝ දෙමල වන අතර මේ දක්වාත් ඒවායින් ලැබෙන්නේ නිදහස් අධ්‍යාපනයකි.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ව්‍යුහය ප්‍රාථමික, කණිෂ්ඨ ද්විතියික, ජ්‍යෙෂ්ඨ ද්විතියික, ජ්‍යෙෂ්ඨ හා තෘතියික යනුවෙන් කොටස් පහකට බෙදා ඇත. ප්‍රාථමික අධ්‍යාපනය වසර හයක් (1 සිට 5 ශ්‍රේණිය දක්වා) පවත්නා අතර මෙම කාලය අවසානයේදී රජයේ පාසැල් වල මෙන්ම පෞද්ගලික පාසැල් වල ශිෂ්‍යයින්ටද තමා කැමැති නම් ශිෂ්‍යත්ව විභාගය නමින් හැඳින්වෙන පරීක්ෂණයකට පෙනී සිටීමේ අවකාශය ඇත. මේ පරීක්ෂණය මගින් සුවිශේෂ දක්ෂතා ඇති සිසුන්ට තමා සිටින දිස්ත්‍රික්කය තුළ හෝ දිස්ත්‍රික්කයෙන් පිටත ඇති වඩාත් හොඳ පාසැලකට ඇතුලත් වීමේ අවස්ථාව හිමි වේ. ප්‍රාථමික අධ්‍යාපනයෙන් පසුව කණිෂ්ඨ ද්විතියික අධ්‍යාපනය වසර 4 ක් (6 සිට 9 ශ්‍රේණිය දක්වා) පවතී. ශ්‍රී ලංකාවේ නීතිය අනුව සියළුම ළමයින් 9 වැනි ශ්‍රේණිය (වයස 14) දක්වා අනිවාර්යයෙන් පාසැල් යා යුතු අතර ඉන් පසු වැඩිදුර අධ්‍යාපනය ලබාගැනීම හෝ පාසැලෙන් ඉවත් වී රැකියාවකට යාම යන දෙකින් එකක් තෝරාගත හැකිය. කෙසේ වුවද අධ්‍යාපන අමාත්‍යංශය සියළුම ශිෂ්‍යයින්ට තදින්ම උපදෙස් දෙන්නේ පසුව සුදුසු රැකියාවක් ලබාගැනීම සඳහා යටත්පිරිසෙයින් අපොස සාමාන්‍ය පෙළ දක්වාවත් ඉගෙනුම කරගෙන යන ලෙසය. මෙම කාලය තුළදී අපොස සාමාන්‍ය පෙල විභාගයට පෙනී සිටීම සඳහා වසර දෙකක් (10-11 ශ්‍රේණි)

සිසුහු ජ්‍යෙෂ්ඨ ද්විතියික අධ්‍යාපනය ලබති. ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනය හැදෑරීමට නම් සිසුන් මෙම විභාගය සමත් විය යුතු වේ. ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනය වසර දෙකක් (12-13 ශ්‍රේණි) පවත්නා අතර ඒ අවසානයේදී අපොස උසස් පෙල නමින් තවත් විභාගයක් තිබේ. මෙම විභාගය සාර්ථක ලෙස නිම කරන සිසුන්ට තෘතියික අධ්‍යාපනය (විශ්ව විද්‍යාල හා ඉන් එහා) ලැබීමේ වරම් හිමි වේ.

**1. ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනය.**

ශ්‍රී ලංකාවේ ජනගහනය උසස් ලෙස අධ්‍යාපනය ලබා ඇති අතර සාක්ෂරතා මට්ටම 91.3% කි. දකුණු ආසියාවේ ඇති ඉහලම සාක්ෂරතා මට්ටමක් හිමි වන්නේ ශ්‍රී ලංකාවටය. මෙහි ගෞරවය ප්‍රධාන වශයෙන්ම නිදහස් අධ්‍යාපන ක්‍රමයට හිමි විය යුතුය. සියළුම ප්‍රාථමික හා ද්විතියික පාසැල් අධ්‍යාපන අමාත්‍යංශය විසින් පරිපාලනය කරනු ලබන අතර ඒවායින් නොමිළයේ අධ්‍යාපනය ලබා දෙනු
ලැබේ. අධ්‍යාපන මාධ්‍යය ප්‍රධාන වශයෙන් සිංහළ හෝ දෙමළ වන අතර ප්‍රධාන වශයෙන්ම කොළඹ හා මහනුවර පිහිටා ඇති පාසැල් ස්වල්පයක ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගැන්වීම කරනු ලැබේ.

ඉහල මධ්‍යම පාන්තික ජනතාවක් බිහි වීම නිසා ශ්‍රී ලංකාව තුළ පුද්ගලික පාසැල්ද ගණනාවක් තිබේ. බොහෝ පුද්ගලික පාසැල් සතුව රජයේ පාසැල් වල නොමැති පහසුකම් තිබේ. මෙම පාසැල් වල සිසුන් මාසික ගාස්තුවක් ගෙවිය යුතු වන අතර ගාස්තුවේ පරිමාව පාසැලේ ජනප්‍රියතාවයේ මට්ටම මත රඳා පවතී.

කොළඹ දිස්ත්‍රික්කය හා ඉන් පිටත ඇති ප්‍රධාන නගරයන්හි ඇති ජාත්‍යන්තර පාසැල් වල සංඛ්‍යාවද සැලකිය යුතු ලෙස ඉහල ගොස් ඇති අතර ඒවා ප්‍රවාසික ජනතාවට සීමා වුවද, පිරිවැය දැරීමේ හැකියාව හා කැමැත්ත ඇති ඕනෑම කෙනෙකුටද සිය දරුවන් ඒවාට ඇතුලත් කරගත හැකිය. පිරිවැයට අමතරව ජාත්‍යන්තර පාසැල් පහත කරුණු අතින්ද වෙනස් වේ: සිසු ජනගහනය, එඩෙක්සෙල් අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය, උසස් උපකාරක, හා උසස් පෙළ විභාග. පාසැල් ස්වල්පයක් විසින් ඉල්ලා සිටි විට කේම්බ්‍රිජ් විභාග සඳහා සිසුන් සූදානම් කිරීමද කරනු ලැබේ.

මෙම පාසැල් බ්‍රිතාන්‍ය පාඨමාලාවන් අනුගමනය කරන හෙයින් ඒවා අධ්‍යාපන අමාත්‍යංශය මගින් පාලනය වන්නේ නැත.

විදේශයක පාසැල් යාමෙන් පසුව ශ්‍රී ලංකාවේ පාසැලකට ඇතුලත් විමට අපේක්ෂා කරන ශිෂ්‍යයකුට රජයේ, පෞද්ගලික හෝ ජාත්‍යන්තර පාසැලක උචිත ශ්‍රේණියට ඇතුලත් වීමේ හැකියාව ඇති අතර ඒ සඳහා ඉල්ලුම්පත්‍රය සමග අවසන් වරට ඉගෙනුම ලැබූ පාසැලෙන් නිකුත් කරන ලද (අවසන් වරට සමත් වූ ශ්‍රේණිය පෙන්නුම් කෙරෙන) අස්වීමේ සහතිකය හා උප්පැන්න සහතිකය ඉදිරිපත් කළ යුතු වේ. විශේෂ හේතූන් මත මෙම අවශ්‍යතාවයන් ලිහිල් කරගැනීමේ හැකියාව ඇත. කෙසේ වුවද, කොළඹ හෝ මහනුවර වැනි අධික ජනගහණයකින් යුත් දිස්ත්‍රික්කයක ජනප්‍රිය රජයේ හෝ පෞද්ගලික පාසැලකට පාසැල් වාරය මැදදී දරුවකු ඇතුලත් කරගැනීම දුෂ්කර කටයුත්තක් විය හැකි වේ.

**2. තෘතියික අධ්‍යාපනය**

ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල අධ්‍යාපනයද නොමිළයේ ලැබේ. රාජ්‍ය විශ්ව විද්‍යාල ක්‍රමය බෙහෙවින් තරඟකාරී වන අතර ඒ නිසා තෘතියික අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව උදා වන්නේ සෑම දිස්ත්‍රික්කයකම සිටින ඉහලම මට්ටමේ සිසුන්ට පමණකි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සරසවි වරම් නොලබන බොහෝ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ විදේශ විශ්ව විද්‍යාලයන්හි අධ්‍යාපනය හැදෑරීම සඳහා විදේශ ගත වන අතර තවත් අය ශ්‍රී ලංකාවේ තිබෙන රජය විසින් හෝ පුද්ගලික අංශය විසින් පවත්වාගෙන යනු ලබන උපාධි ප්‍රදානය කරන ආයතන වලට සම්බන්ධ වෙති. සරසවි වරම් නොලබන සිසුන්ට රජයේ විශ්ව විද්‍යාලයයන්හි බාහිර උපාධි පාඨමාලා හැදෑරීමේ හෝ විවෘත විශ්ව විද්‍යාලයයට ඇතුලත් වීමේ අවස්ථාවද ඇත. යාන්ත්‍රික හා විද්‍යුත් විෂයයන් සම්බන්ධ විශේෂඥතාවය ඇති වෘත්තිය තාක්ෂණික විද්‍යාලයයන්ද තිබේ. දැනට රජයේ අරමුදලින් පවත්වාගෙන යනු ලබන ප්‍රධාන විශ්ව විද්‍යාල 15 ක් ශ්‍රී ලංකාවේ පවතී. විශ්ව විද්‍යාල පණතට සිදු වූ සංශෝධනත් සමග තමන්ගේම උපාධි ප්‍රදානය කිරීමට ආයතනයන්ට අවසර දී ඇති අතර

ඒවායින් වඩාත්ම කැපී පෙනෙන ආයතනය වන්නේ තොරතුරු තාක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයයි.

ඕනෑම ජාත්‍යන්තර පාඨමාලාවක් මගින් උපාධි ලබා ඇති ශ්‍රී ලාංකික සිසුන් දේශීය විශ්ව විද්‍යාලයයකට ඇතුලත් වීමට නම් දේශිය උසස් පෙල විභාගය සම්පූර්ණ කළ යුතු වුවත් බොහෝ විට මේ සම්බන්ධ ව්‍යතිරේකයන් ක්‍රියාත්මක වේ. විශ්ව විද්‍යාලයයන්ට ඇතුලත් වීම අතිශයින්ම තරඟකාරී වන අතර සෑම ශිෂ්‍යයකු විසින්ම ලබාගත් මුළු ලකුණු (Z score) මත එය පදනම් වේ. මෙම මූලික උපාධි වැඩසටහන්ද රජයේ නිදහස් අධ්‍යාපන ක්‍රමය විසින් ආවරණය කෙරෙන අතර (දක්ෂතා මත පදනම් වෙමින්) ඇතැම් සිසුන් ‘‘මහපොල ශිෂ්‍යත්ව වැඩසටහන’’ යටතේ ප්‍රදානයකටද හිමිකම් ලබති.

විශ්ව විද්‍යාලයයන් විසින් පශ්චාත් උපාධි ඩිප්ලෝමා හා සහතික වැඩ සටහන් ගණනාවක් පවත්වනු ලබන නමුත් ඒවා රජයේ නිදහස් අධ්‍යාපන ක්‍රමය යටතේ ආවරණය නොවේ. මෙම වැඩසටහන් සියළුම ශිෂ්‍යයින් වෙනුවෙන් විවෘතය. විදේශයක අධ්‍යාපනය ලබා ඇති සිසුවකුට පශ්චාත් උපාධි/ඩිප්ලෝමා හෝ සහතික වැඩසටහනක් අනුගමනය කිරීමේ අවශ්‍යතාවය තිබේනම් ඔහු/ඇය විසින් තමන්ගේ සවිස්තරාත්මක අධ්‍යාපන සහතික වල සහතික කළ පිටපත් වැනි අදාල ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතු වේ. වෙනත් ආයතන කිහිපයක් විසින්ද පවත්වනු ලබන බාහිර උපාධි, ඩිප්ලෝමා හා පශ්චාත් උපාධි පාඨමාලාවන් තිබේ. මෙම ආයතනයන්ට ඇතුලත් වීමේ නිර්නායකයන් විවිධ වන අතර වැඩසටහන් පිළිබඳ දැන්වීම් සාමාන්‍යයෙන් පුවත්පත් වල පළ කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ විවෘත විශ්ව විද්‍යාලය විසින්ද මූලික උපාධි වැඩසටහන් ඇතුළු දුර අධ්‍යයන වැඩසටහන් (මේවාද රජයේ නිදහස් අධ්‍යාපන ක්‍රමය මගින් ආවරණය නොවේ) පවත්වනු ලබන අතර විදේශයන්හි අධ්‍යාපනය ලැබූ සිසුන් සඳහා එම වැඩ සටහන්ද විවෘතව ඇත. ශ්‍රී ලංකාවේ විවෘත විශ්ව විද්‍යාලයයේ පාඨමාලා හැදෑරීම සඳහා වයස් බාධකයක් නැත.

විවිධ දිස්ත්‍රික්කයන්හි රජයේ තාක්ෂණික විද්‍යාල ගණනාවක් තිබේ. ඒවා විසින් වෘත්තීය පුහුණු වැඩසටහන්, ඩිප්ලෝමා වැඩසටහන් හා සහතික පාඨමාලාවන් පවත්වනු ලැබේ. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අධ්‍යාපන හා පුහුණු දෙපාර්තමේන්තුව, උසස් තාක්ෂණික කවුන්සිලය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය හා තාක්ෂණික අධ්‍යාපනය පිළිබඳ ජාතික ආයතනය වැනි රාජ්‍ය අංශයේ ආයතන ගණනාවක් පරිපාලනය කරනු ලබති. පෞද්ගලික අංශයේ ආයතන විශාල සංඛ්‍යාවක් විසින්ද වෘත්තීය පුහුණු පහසුකම් සපයනු ලැබේ. මේවායේ ඉලක්ක කණ්ඩායම විවිධ වන අතර එය රැකියා විරහිත තරුණයින්ගෙන්, ගැමි පිරිමින්ගෙන් හා ගැහැණුන්ගෙන් සහ පාසැල් හැර යන්නන්ගෙන් සමන්විත වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර පිවිසෙන්න :

http://en.wikipedia.org/wiki/List_of_universities_and_colleges_in_Sri_Lanka

http://www.moe.gov.lk/

| **වියාවනය** |
|---|
| සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය තොරතුරු රැස් කරන ලද්දේ බොහෝ පරිස්සමිනි. එය තොරතුරු සපයන්නේ සිය හොඳම දැනුමේ හැටියට හා හෘදය සාක්ෂියට එකඟවය. කෙසේ වුවද සපයා ඇති තොරතුරු වල නිවැරදිතාවය පිළිබඳව වග කීමට එය බැඳෙන්නේ නැත. තවද සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය විසින් සපයනු ලැබ ඇති තොරතුරු මත පදනම්ව එළඹෙන නිගමනයන් හෝ ප්‍රතිඵල සම්බන්ධයෙන්ද සංක්‍රමණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය වග කියන්නේ නැත |

# යුරෝපීය ප්‍රතිසංකලන ජාලිය විශේෂිත ක්‍රියාකාරී වැඩසටහන අනුග්‍රාහකයින්

| S.N | ERIN Partner Countries<br>එරින් හවුල්කාර රටවල් | S.N | ERIN Partner Institutions<br>එරින් හවුල්කාර ආයතන |
|---|---|---|---|
| 1 | ඔස්ට්‍රියාව | 1 | අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශය<br>Ministry of Interior |
| 2 | ඕස්ට්‍රේලියාව | 2 | ආගමන සහ දේශ සීමා ආරක්ෂණ දෙපාර්තුමේන්තුව<br>Department of Immigration and Border Protection |
| 3 | බෙල්ජියම | 3 | ෆෙඩරල් ආගමන විගමන කාර්යාලය<br>Federal Immigration Office |
| | | 4 | රැකවරණය පතන්නන් පිළිබඳ ෆෙඩරල් ආයතනය<br>Federal Agency for the Reception of Asylum Seekers |
| 4 | ඩෙන්මාර්කය | 5 | විදේශ කටයුතු අමාත්‍යාංශය<br>Ministry of Foreign Affairs |
| 5 | ෆින්ලන්තය | 6 | ක්රොඒෂියානු ආගමන විගමන සේවාව<br>Finnish Immigration Service |
| 6 | ප්‍රංශය | 7 | ප්‍රංශ ආගමන සහ ඒකාබද්ධතා කාර්යාලය<br>French Immigration and Integration Office |
| 7 | ජර්මනිය | 8 | සංක්‍රමණිකයන් සහ සරණාගතයන් සඳහා වන ෆෙඩරල් කාර්යාලය<br>Federal Office for Migration and Refugee |
| 8 | ග්‍රීසිය | 9 | මහජන සාමය සහ පුරවැසි ආරක්ෂක අමාත්‍යාංශය<br>Ministry of Public Order and Citizen Protection |
| 9 | ඉතාලිය | 10 | අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශය<br>Ministry of Interior |
| 10 | ලක්සම්බර්ග් | 11 | යුරෝපීය සහ විදේශ කටයුතු අමාත්‍යාංශය<br>Ministry of European and Foreign Affairs |
| 11 | මෝල්ටාව | 12 | ස්වදේශ කටයුතු සහ ජාතික ආරක්ෂාව පිළිබඳ අමාත්‍යාංශය<br>Ministry for Home Affairs and National Security |
| 12 | නෙදර්ලන්තය | 13 | නැවත තමරටට ගෙන්වා ගැනීම සහ පිටවීමේ සේවාව<br>Repatriation and Departure Service |
| 13 | නෝර්වේ | 14 | ආගමනිකයන් සඳහා වන නෝර්වේජියානු අධ්‍යක්ෂක මණ්ඩලය<br>Norwegian Directorate of Immigration |
| 14 | රුමේනියාව | 15 | ආගමනිකයන් සඳහා වන සාමාන්‍ය පරීක්ෂක මණ්ඩලය<br>General Inspectorate for Immigration |
| 15 | ස්පාඤ්ඤය | 16 | සංක්‍රමණියන් සඳහා වන ඒකාබද්ධ සංක්‍රමණික මණ්ඩලය<br>Integration of Immigrants Migration Board |
| 16 | ස්වීඩනය | 17 | ස්වීඩන් සංක්‍රමණ නියෝජිතායතනය<br>Swedish Migration Agency |
| 17 | ස්විස්ටර්ලන්තය | 18 | සංක්‍රමණය සඳහා වන රාජ්‍ය ලේකම්<br>State Secretariat for Migration |
| 18 | එක්සත් රාජධානිය | 19 | ආගමන බලාත්මක කිරීමේ කාර්යාලය<br>Home Office – Immigration Enforcement |